# බණආරාධනාදි සඞ්ග්‍රහය.

මෙහි

## බණආරාධනා 2,
## පිරිත්ආරාධනාව,
## පිරිත්පේකිරීම, මහපිරිත,
## ලිතලිවීම, දේවාලපතලිවීම,
## විහාරඅස්න, දෙරකඩඅස්න,
## අනුශාසනා, ඇතුළති.

ඉතා වැදගත් දැන්වීමක් අගට යොදන ලදී

උගත් ස්වාමීන් වහන්සේ කෙනෙක්

විසින්

ලියන ලදී.

දොන් පීරිස් ගුණතිලක රජිස්ටර් මහත්මයා

විසින්

පානදුරේ

සුචරිතොදය යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවන ලදී.

1899.

# පන්සිල් ඉල්ලීම.

(1)

සුබ ය හිලෝ හිරුමෙන් උදයාසල සැඩකිරණින් දිලි මුලු දෙරණේ
නිබ ය කුසුන්බඳුනේ පිරුණාමත දෙව්සමුදු පිළිගත් බැති ණේ
අ බ ය පුරේ අමසම්පත් ගෙන දෙන මුනිරජ වදහල පෙළදම් ණේ
ස බ ය මෙතැන් සතහට පංසිල් දෙවනාලෙස නමදමි යතිසඳි ණේ.

(2)

සු වි පු ල් සිත කොදමල් තරු මුතුවැල් හර හෙළපු ල්
සු ම ඟු ල් බණ ගෙය තුල්වන මෙඩියල්ලම කරලො ල්
සු වි ස ල් සිත යසඳුල් නුබ හැමකල් දෙසු දසබු ල්
සු රලො ල් කාර පසසිල්දෙව සරිකල් යතිඳුනි තු ල්.

(3)

මුහුදමැදදි සත්සි යක් නැවක් එක් බිඳිමෙන්
ලවණදිය බොමින් සිල් ගත් වෙලෙන්දෙ පවා ඒ
දිවපුරට එකත්තෙන් එක් සැනේකින් යවා ලූ
දුන මැනවි එපංසිල් මෙත් පවත්වා සොඳින් දූන්.

---

## බ ණ අ රා ධ නා ව.

(4)

ගගනතලමැද දිලෙනපුන්සඳ ලෙසටබැඳිසුදු උඹුවියන්
අවටවටතරු විලසඛබලන අඳුරුදුරුකර ලාපහන්
රුවබවගුරුලි පෙලටමලලොඹු දෙරටුවලසැදි පුන්කලස්
එමැදවැඩඋන් බණඅසුන්පිට යතිඳුපාවැඳ ලාකියමි.

(5)

අමිතසිරින්පිරි කුලගපසත්නර නාරිගණරද නාහිති නා
සුපිපිකුසුම්තුරු මනනදසෙන්සැදි පතලමෙමඩයා රජෙටනිම නා
අසල්මෙගම්වල වසනදිගන්තර සහිතමෙගම්සුජ නාබැහිනා
කරවුදහම්සබ මැදබණසුන්වැඩ හිදමුනිනන්දන ඔබවිසි නා.

(6)

ලොකාදිසාගත  ඤාණකමාඤාස  කාලසාධුමිත  නාදක  රෙ
උණ්ණාතයසිසු  බණ්ඩිතකෙතුනි  රශ්මරකිංකිණී  රාවක  රෙ
ජපපදසෙවිත  රුක්ඛගණේණිව  සොභනවෙහාසු  මිජ්ඣව  රෙ
දෙවසභාරිව  මාලපතොසම  ලඞ්කාතසුදාර  ධම්මක  රෙ.

(7)

උතුමිමායා  බිසවකුසදස  මිසක්වැඩසිටි  ම ඬග ල මී
අතින් ඉහබඹු  ගෙනාරන්දූල  පිටටවැඩිජය  ම ඬග ල මී
පැතුම්බලයෙන් පියුම්පිටවැඩ  කරපුසිහනද  ම ඬග ල මී
උතුම්තිසරණ  බෙලෙන්යතිදුට  වේයජයසිරි  ම ඬග ල ,මී

(8)

දිනාමුනිමර  භණාබිදබුදු  වුනාදෙසුදවි  තිසර  ණා
සනාදුක්සන  සනාසව්සත . සසරසයුරෙන්  ගොඩල  නා
ගුණාකරදෙසු  දහම්අමරස  පොවනමෙන්දෙස  නාමෙ  නා
මිනාසිත්පිණ  පිණාබබවෙන  කරවිවැදආ . රාද  නා.

---

බණකියමන ආසනදෙකෝනම් තවත් මෙතනට කියයුතු ගාථාවක්.

---

(9)

සොබනමුනිබණ  දෙසනසහගණ  දෙනම්හිදයුග  ආස  නා
කරනපුදසිරි  හොහැරහැමදෙන  එක්වබැතිපෙම්  වඩම්  නා
මරණසතසිහි  කරනසව්සත  අදරඇතිවම .  අසම්  නා
පිවරකරුණා  උතුම්යතිදුට  කරම්වැදආ  රාද  නා.

(10)

වැඩතිද  බණසුත්  දෙසනා  සදහ  මී
අද අප  සැමගේ  සිත්ගිනි  නිවමි  න්
අප යති  රුවනට  සුබසිරි  දෙවමි  න්
සැමදෙවි  රැකදෙන්  කරුණා  කරමි  න්.

(11) අමරහමර  සෙවිතපපසහ  පාදපඞ්ක  ජෙ
සුජනකමල  බොධනෙකවාරු  සුරසකති  හො
ගගනතලසන  චන්දමණ්ඩලංව  පිණනාණ  නො
වදථභවන  නෙකසුපපසහ . ධම්මමුතන  මො.

ශ්‍රී මත් මධුරොදාර ගම්භීර ධීර වීර වික්‍රම ප්‍රතාපාලඞ්කෘතාති ප්‍රවර අනෙක ගුණගණානුභාවොත්පන්න ලකළසිරි පතලකර විපුලවූ සකල සුර නර බඹුන් පැළඳි හිස කිරුළුවන් විකල පත් ශ්‍රී සදිටුන් එනමසිරි පාපියුම් ඔවුන් හිස පළදවා කෙලෙස්රුපු බිඳහැරා ඝොරමරු සුන්කරා නිවන්සිරි පුරපුරා ලොව්තුරා බුදුවූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ විසින් දෙශනාකර වදාරණලද්දාවූ—සුවාසූදහසක් ධර්මස්කන්ධයන් අතුරෙන් මෙම තුන් යම් රාත්‍රිය මුලුල්ලෙහි දහම් දෙසනු පිණිස උදාරතර ශ්‍රද්ධාදීන් සමන්විතව විසිතුරුකොට කරවන ලද නිර්ජරවර ශ්‍රීවිභූති ඇති මෙම ධර්මශාලාවෙහි පණවනලද ධර්මාසනාරූඪව වැඩ උන්නාවූ. පින්වත් ස්වාමීන් වහන්ස අනෙක දිව්‍යසෘද්ධි ප්‍රතාප සොභනීයවූ සතර වරම් දෙවිමහාරාජෝත්තමයාණන් වහන්සේ ප්‍රමුඛකොට ඇති සියලුම දිව්‍යරාජසමූහයාටද අද මෙතැන්හි රැස්වූ සකල ශ්‍රද්ධාවන්ත සත්පුරුෂාදීන්ටද ඔබවහන්සේටද මටද අප සියලු දෙනාගේ ගුරුවර දෙමව්පියාදීන්ටද මතු ස්වර්ගාපවර්ගසම්පත්ති ප්‍රතිලාභයට පැමිණෙනු පිණිස අභිප්‍රායානුකූලවූ විසිතුරු මධුර ධර්මයක් දෙශනාකරවදාළ මැනවි.

අනිකුදු බණ අරාධනාවක්.

# පන්සිල් ඉල්ලීම.

(12)

කොම ල මලලෙස දුනදසඟිලි පුදාපැවෙත පේමයෙ න්නේ
නි ම ල මලකැටි බොලඳසුරතල් බසින්ආසිරි දීඋතු මි
වි ක ල කාළසිත් සුදනඅතුමැති ලත්මෙමාකර අයදිමි න්
ප හ ල කරමුනි සරණපන්සිල් දෙවන්හිමිකරු ණාසිති න්.

පන්සිල් ගත්තාට පසු කියන බණආරාධනාව.

(13)

රූවැ ති වගුරලී පත්තිතිරජව නිකාළඹුවිය නින් ව සා
නිමැ ති විසිතුරු එරන්රසුදුල් දිලෙනමිනිමුතු බැඳ තො සා
කාමැ ති මොක්සැප ඉසුරුසම්පත් දෙව්ලොවෙසිරි සැප නි සා
කිය මි සුරතල් තෙපුල්මමදූන් දම්හසුන්මුල දන ග සා.

(14)

සුරියවංස භූමිපාල භාරිතාභි භාසුරෙ
රුචිරතුංග තොරණෝරු දීපමාල ලඞ්කතෙ
සුසිරතාල භෙරිසංඛ මද්දලාභි ඝොසිතෙ
තූරියනාම භූසිතාභි රූපසාර මණ්ඩපෙ.

සවස්ති ශ්‍රී කර මනොරඤ්ජන භූඤනඤන චන්ද්‍රිකායමානවූ අපසම්‍යක්සම්බුඩසර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින් වරාතුලොත්තර ගම්භීර ධීරශ්‍රවණීය සද්ධර්මප්‍රදායක මෘදඞ්ගභෙරිධ්වනින් සම්මොහනිද්‍රාපගම ශ්‍රීමත් හරි හර හිරණ්‍යගර්භ සුරාසුරොරගාදි මුනිවරනිසෙවිතාරවින්ද දක්ෂිණාපෙන්ද්‍ර ඉන්ද්‍ර චන්ද්‍රශෙඛර නරෙන්ද්‍ර නාගෙන්ද්‍රාදි සමස්තරාජෙන්ද්‍ර ක්‍රිටකූටමාණික්‍යයථ නිහිලාඞ්ගස් සඞ්ඝාලලසිත අඞ්ඝ්‍රිකමලයුගලොපසොභිතවූ අපසම්‍යක්සම්බුඩසර්වඥරාජොත්තමයාණන්වහන්සේවිසින් කර්ණාමෘතවර්ණ මධුරවචනවිලාසිත සුභාසිතමනොහරවර්ණවිසසන්ද සමලඞ්කෘතොදාර දුර්වාර සරඝොර මාරායතීනඞ්කාර සංහාර ධෘතිධාරධෘඪ වීරතර ඝොරධර්මප්‍රතාපාලඞ්කෘතවූ සර්වඥරාජොත්තමයාණන්වහන්සේවිසින්—මධුමදමුදිත ලලිත රතිකර නිකර මනොහර කුරවීකනාද නිර්ඝොෂ අෂ්ටාඞ්ගසමුපෙත බ්‍රහ්මස්වරවිහිදුවා දෙශනාකාරනලද්දාවූ ත්‍රිපිටකධර්මය අතුරෙන් අද මෙතැන්හි පැමිණියාවූ ගෘහස්ථප්‍රව්‍රජිත දායකකාරකාදි සුහෘත්ජනසමූහයාටද මටද මාගේ ගුරුවර දෙමව්පිය බන්ධුමිත්‍රාදීන්ටද මතු ස්වර්ගාපවර්ගයම්පත්තිප්‍රතිලාභය පිණිස ඔබවහන්සේලාට අභිප්‍රායානුකූලවූ විසිතුරු මධුරධර්මයක් දෙශනාකරවදාළ මැනවි.

(15)

කලි භූ දේශෙ න් බමුණුආ දූ ඇතාඉල්ලූ ම ඞග ල මී
සිලි භූ නොවසි ත දනටදී ලා පැතුබුදුබව ම ඞග ල මී
සුරැ දු සිල්රැ ක සයුරමැද දී පෝයජේලතු ම ඞග ල මී
සුරැ දු ගුව නේ තපස්රකිමින් ඔබටවේජය ම ඞග ල මී·

(16)

විඩිකහිරි යේ තපසෙවැඩහි ඳ පැතුබුදුබව ම ඞග ල මී
අඩනයක්නැ ති ජූජබමු ණා කුමරුඉල්ලූ ම ඞග ල මී
එළවනිකෙතණ්ඩි යේ එපැන්වත්කොට කුමරුදන්දුන්ම ඞග ල මී
මෙළෙවනිආසි රි බෙලෙන්යකිඳුට ·වේසජයසිරි ම ඞග ල මී.

(17)

මු නි ඳු මහ මා ශාකුසින්ඛ ශි පිපියුම්පටවැඩ ම ඞග ල මි
මු නි ඳු දසවි ද පෙරුම්බලයෙන් මරුන්ඛිදහැරම ඞග ල මි
මු නි ඳු සත්ස ති යවාඅටවෙ නි සතියෙඛණදෙසුම ඞග ල මි
මු නි ඳු බලයෙ න් යතිඳුඔබහට වේයජයසිරි ම ඞග ල මි.

(18)

ආ ල වන සේ සතක්පියවර උතුරුදෙසවැඩි ම ඞග ල මි
ආ ල වඹසි ත අතුරුරුසපිට ගොසින්දන්දුන් ම ඞග ල මි
බා ල වනයසෙ ම පියරජුන්ගෙන් වැඳුන්ගත්ජය ම ඞග ල මි
සී ල තෙදබ ල යතිතුමන්හට වේයජයසිරි ම ඞග ල මි.

(19)

නරලොවින්තු න් පියවරින්මු නි සුරබිමන්වැඩි ම ඞග ල මි
සුරබඹුන්හ ට දම්දෙසාසි රි බරනිවන්දුන් ම ඞග ල මි
සුරරදුන්මැ වි රන්හිණෙන්සං කස්සපුරවැඩි ම ඞග ල මි
ඊමළතුම්මු නි බෙලෙන්යතිඳුට වේයජයසිරි ම ඞග ල මි.

(20)

තුන්සොඳුන් ද ගැබක්බැඳ ලා සැක්‍රබවනේ ම ඞග ල මි
එදිනඅපෙමු නි මහණවෙනබ ව දූකාපුනදෙවියෝ ම ඞග ල මි
මෙකාපපවතී න ලොව්තුරාමු නි කරතිපූජ ම ඞග ල මි
තෙදින්අදිප ති යතිතුමන්හ ට වේයජයසිරි ම ඞග ල මි.

(21)

පළමුසතිය ක් දෙවෙනිබෝමැ ඩ විදුරසුන්වැඩි ම ඞග ල මි
තෙවෙනිසක්මන් සතියෙසිව්වෙ නි රුවන්විම නේ ම ඞග ල මි
සවෙනිමුචලි ඳු නාගදර නේ සතියවැඩළන් ම ඞග ල මි
මෙවෙනිඅනුහ ස් බෙලෙන්යතිඳු ට වේයජයසි රි ම ඞග ල මි.

(22)

ඉඤ්ඤාවීරත ර රඤ්ජිතොරුභු ජ මඤ්ජුරසසජ ය ම ඞග ල මි
භුඤ්ජිතන ය නාලිකාමභු ජ සන්නිභසසජ ය ම ඞග ල මි
මඤ්ඤමානරු පූ රාජමොලිම ණි ලඞකාතෙජිත ව ම ඞග ල මි
තොතුලෙරව ර රාජරාජම් ජ ජයශ්‍රීජ ය ම ඞග ල මි.

# පිරිත් ආරාධනාව.

1 විපත්තිපටිබාහාය සබ්බසම්පත්තිසිද්ධියා,
සබ්බදුක්ඛවිනාසාය පරිත්තං බ්‍රූථ * මඞ්ගලං.

2 විපත්තිපටිබාහාය සබ්බසම්පත්තිසිද්ධියා,
සබ්බභයවිනාසාය පරිත්තං බ්‍රූථ මඞ්ගලං.

3 විපත්තිපටිබාහාය සබ්බසම්පත්තිසිද්ධියා,
සබ්බරොගවිනාසාය පරිත්තං බ්‍රූථ මඞ්ගලං.

පිරිත්ආරාධනාව නිමි.

# පිරිත් පේකිරීම.

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති– අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූපනිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතනනිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදානනිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාතිනිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති.

අනෙකජාතිසංසාරං සන්ධාවිස්සං අනිබ්බිසං,
ගහකාරකං ගවෙසන්තො දුක්ඛා ජාති පුනප්පුනං.

ගහකාරකදිට්ඨොසි පුන ගෙහං න කාහසි,
සබ්බා තෙ ඵාසුකා භග්ගා ගහකූටං විසංඛිතං,
විසඞ්ඛාරගතං චිත්තං තණ්හානං ඛයමජ්ඣගාති.

ඉතිපිසො භගවා අරහං සම්මා සම්බුද්ධො, විජ්ජාචරණසම්ප
න්නො සුගතො ලොකවිදූ, අනුත්තරො පුරිසදම්මසාරථි, සත්ථා
දෙවමනුස්සානං බුද්ධො භගවාති. ස්වාක්ඛාතො භගවතා ධම්මො,
සන්දිට්ඨිකො අකාලිකො එහිපස්සිකො ඔපනයිකො, පච්චත්තං වෙදි
තබ්බො විඤ්ඤූහීති. සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, උජු
පටිපන්නො භගවතො සාවකසඞ්ඝො, ඤායපටිපන්නො භගවතො
සාවකසඞ්ඝො, සාමීචිපටිපන්නො භගවතො සාවකසඞ්ඝො, යදිදං
චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිසපුග්ගලා එසභගවතො සාවකස
ඞ්ඝො, ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකර
ණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

1 බාහුං සහස්සමභිනිම්මිතසායුධං තං
ගිරිමෙඛලං උදිතඝොරසසෙනමාරං,
දානාදිධම්මවිධිනා ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

2 මාරාතිරෙකමභියුජ්ඣිතසබ්බරත්තිං
ඝොරම්පනාලවකමක්ඛම * ථද්ධයක්ඛං,
ඛන්තීසුදන්තවිධිනා ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

3 නාලාගිරිං ගජවරං අතිමත්තභූතං
දාවග්ගිචක්කමසනීව සුදාරුණන්තං,
මෙත්තම්බුසෙකවිධිනා ජිතවාමුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

4 උක්ඛිත්තඛග්ගමතිහත්ථසුදාරුණන්තං
ධාවං† තියොජනපථං ගුලිමාලවන්තං,
ඉද්ධීභිසංඛතමනො ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

5 කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනීයා
විඤ්චාය ‡ දුට්ඨවචනං ජනකායමජ්ඣෙ,
සන්තෙන සොමවිධිනා ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

---

* මථද්ධයක්ඛං, කියා සමහරු කියති ඒ නොමැනවි ථද්ධ, යිකියයුතු
† ධීවතිං, යි කීම වැරදියි.
‡ කිඤ්චාය, යි කීම වැරදියි.

6 සච්චං විහාය මතිසච්චකවාදකෙතුං
වාදාභිරොපිතමනං අතිඅන්ධභූතං,
පඤ්ඤාපදීපජලිතො ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

7 නන්දොපනන්දභුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙරභුජගෙන දමාපයන්තො,
ඉද්ධූපදෙසවිධිනා ජිතවා මුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

8 දුග්ගාහදිට්ඨිභුජගෙන සුදට්ඨහත්ථං
බ්‍රහ්මං විසුද්ධිජුතිමිද්ධිබකාභිධානං,
ඤාණාගදෙන විධිනා ජිතවාමුනින්දො
තංතෙජසා භවතු තෙ ජයමඞ්ගලානි.

9 එතාපි බුද්ධජයමඞ්ගලඅට්ඨගාථා
යො වාචකො දිනදිනෙ සරතෙ මතන්දී,
හිත්වාන නෙකවිවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො.

10 භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා,
සබ්බබුද්ධානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ.

12 භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා,
සබ්බ ධම්මානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ.

13 භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා,
සබ්බසඞ්ඝානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ.

14 නක්ඛත්තයක්ඛභූතානං පාපග්ගහනිවාරණා,
පරිත්තස්සානුභාවෙන හන්තු තෙසං උපද්දවෙ.

(මිට ඉක්බිති තුයයීනාද පැවැත්වූ කල්හි පිරිත්පත් අතට ගෙන කරණීයමෙත්තසුත්‍රය- රතනසුත්‍රයෙහි "යං කිඤ්චි විත්තං" යනාදි ගාථා පටන් "ඛීණං පුරාණං" යනාදි ගය කෙළවර කොට බැණ මෙහි පහත දක්වන "යං දුන්නිමිත්තං" යනාදි ගාථා බැණ පිරිත් පේකිරීම නිමවනු.)

යංදුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච යොචාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං බුද්ධානුභාවෙන විනාසමෙන්තු.

යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච යොචාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං ධම්මානුභාවෙන විනාසමෙන්තු.

යං දුන්නිමිත්තං අවමඞ්ගලඤ්ච යො චාමනාපො සකුණස්ස සද්දො,
පාපග්ගහො දුස්සුපිනං අකන්තං බුද්ධානුභාවෙන විනාසමෙන්තු.

දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා භයප්පත්තා ච නිබ්භයා,
සොකප්පත්තා ච නිස්සොකා හොන්තු සබ්බෙපි පාණිනො.

සබ්බ බුද්ධා බලප්පත්තා පච්චෙකානඤ්ච යං බලං,
අරහන්තානඤ්ච තෙජෙන රක්ඛං බන්ධාමි සබ්බසො.

සිරිත් ජේතිරීව නිමි.

# මහපිරිත.

එවං මෙ සුතං එකං සමයං භගවා, සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. අථ ඛො අඤ්ඤතරා දෙවතා, අභික්කන්තාය රත්තියා අභික්කන්තවණ්ණා, කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්වා, යෙන භගවා තෙනුපසඞ්කමි උපසඞ්කමිත්වා, භගවන්තං අභිවාදෙත්වා එකමන්තං අට්ඨාසි, එකමන්තං ඨිතා ඛො සා දෙවතා, භගවන්තං ගාථාය අජ්ඣභාසි. බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං, ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රෑහි මඞ්ගලමුත්තමං. අසෙවනා ච බාලානං පණ්ඩිතානඤ්ච සෙවනා, පූජා ච පූජනීයානං එතං මඞ්ගලමුත්තමං. පතිරූපදෙසවාසො ච පුබ්බෙ ච කතපුඤ්ඤතා, අත්තසම්මාපණිධි ච එතං මඞ්ගලමුත්තමං. බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයො ච සුසික්ඛිතො, සුභාසිතා ච යා වාචා එතං මඞ්ගලමුත්තමං. මාතාපිතු උපට්ඨානං පුත්තදාරස්ස සංගහො, අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගලමුත්තමං. දානඤ්ච ධම්මචරියා ච ඤාතකානඤ්ච සංගහො, අනවජ්ජානි කම්මානි එතං මඞ්ගලමුත්තමං. ආරතී විරතී පාපා මජ්ජපානා ච සඤ්ඤමො, අප්පමාදො ච ධම්මෙසු එතං මඞ්ගලමුත්තමං. ගාරවො ච නිවාතො ච සන්තුට්ඨී ච කතඤ්ඤුතා, කාලෙන ධම්මස්සවණං එතං මඞ්ගලමුත්තමං. ඛන්තී ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං, කාලෙන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං. තපො ච බ්‍රහ්මචරියඤ්ච අරියසච්චාන දස්සනං, නිබ්බාණසච්ඡිකිරියා ච එතං මඞ්ගලමුත්තමං. ඵුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති, අසොකං විරජං ඛෙමං එතං මඞ්ගලමුත්තමං. එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා, සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මඞ්ගලමුත්තමන්ති.

මහාමඞ්ගලසුත්තං නිට්ඨිතං.

යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, සබ්බෙව භූතා සුමනා භවන්තු අථොපි සක්කච්ච සුණන්තු භාසිතං, තස්මා හි භූතා නිසාමෙථ සබ්බෙ මෙත්තං කරොථ මානුසියා පජාය, දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං තස්මා හි නෙ රක්ඛථ අප්පමත්තා, යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා සග්ගෙසු වා යං රතනං පණීතං, න නො සමං අත්ථි තථාගතෙන ඉදම්පි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. ඛයං විරාගං අමතං පණීතං යදජ්ඣගා සක්‍යමුනී සමාහිතො, න තෙන ධම්මෙන සමත්ථි කිඤ්චි ඉදම්පි ධම්මෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යං බුද්ධසෙට්ඨො පරිවණ්ණයී සුචිං සමාධිමානන්තරිකඤ්ඤමාහු, සමාධිනා තෙන සමො න විජ්ජති ඉදම්පි ධම්මෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යෙ පුග්ගලා අට්ඨසතං පසත්ථා චත්තාරි එතානි යුගානි හොන්ති, තෙ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා එතෙසු දින්නානි මහප්ඵලානි, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන නික්කාමිනො ගොතමසාසනම්හි, තෙ පත්තිපත්තා අමතං විගය්හ ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යථින්දඛීලො පථවිං සිතො සියා චතුබ්භි වාතෙභි අසම්පකම්පියො, තථූපමං සප්පුරිසං වදාමි යො අරියසච්චානි අවෙච්ච පස්සති, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යෙ අරියසච්චානි විභාවයන්ති ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි, කිඤ්චාපි තෙ හොන්ති භුසප්පමත්තා න තෙ භවං අට්ඨමං ආදියන්ති, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. සහාවස්ස දස්සනසම්පදාය තයස්සු ධම්මා ජහිතා භවන්ති, සක්කායදිට්ඨි විචිකිච්ඡිතං ච සීලබ්බතං වාපි යදත්ථි කිඤ්චි, චතූහපායෙහි ච විප්පමුත්තො ඡ චාභිඨානානි අභබ්බො කාතුං, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. කිඤ්චාපි සො කම්මං කරොති පාපකං කායෙන වාචා උද චෙතසා වා, අභබ්බො සො තස්ස පටිච්ඡාදාය අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ, තථූපමං ධම්මවරං අදෙසයී නිබ්බානගාමිං පරමං හිතාය, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. වරො වරඤ්ඤූ වරදො වරාහරො අනුත්තරො ධම්මවරං අදෙසයී, ඉදම්පි බුද්ධෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං විරත්තචිත්තා ආයතිකෙ භවස්මිං,

තෙ ඛීණබීජා අවිරූළ්හිච්ඡන්දා නිබ්බන්ති ධීරා යථා'යම්පදීපො, ඉදම්පි සඞ්ඝෙ රතනං පණීතං එතෙන සච්චෙන සුවත්ථි හොතු. යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්සපූජිතං බුද්ධං නමස්සාම සුවත්ථි හොතු. යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්සපූජිතං ධම්මං නමස්සාම සුවත්ථි හොතු. යානීධ භූතානි සමාගතානි භුම්මානි වා යානිව අන්තලික්ඛෙ, තථාගතං දෙවමනුස්සපූජිතං සඞ්ඝං නමස්සාම සුවත්ථි හොතු.

රතනසුත්තං නිට්ඨිතං.

---

කරණීයමත්ථකුසලෙන යං තං සන්තං පදං අභිසමෙච්ච, සක්කො උජූ ච සුජූ ච සුවචො චස්ස මුදු අනතිමානී. සන්තුස්සකො ච සුභරො ච අප්පකිච්චො ච සල්ලහුකවුත්ති, සන්තින්ද්‍රියො ච නිපකො ච අප්පගබ්භො කුලෙසු අනනුගිද්ධො. න ච ඛුද්දං සමාචරෙ කිඤ්චි යෙන විඤ්ඤූ පරෙ උපවදෙය්‍යුං, සුඛිනො වා ඛෙමිනො හොන්තු සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා. යෙ කෙචි පාණභූතත්ථි තසා වා ථාවරා වා අනවසෙසා, දීඝා වා යෙ මහන්තා වා මජ්ඣිමා රස්සකා අණුකථූලා. දිට්ඨා වා යෙ ච අදිට්ඨා යෙ ච දූරෙ වසන්ති අවිදූරෙ, භූතා වා සම්භවෙසී වා සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා. න පරො පරං නිකුබ්බෙථ නාතිමඤ්ඤෙථ කත්ථචි නං කඤ්චි, ව්‍යාරොසනා පටිඝසඤ්ඤා නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය. මාතා යථා නියං පුත්තං ආයුසා එකපුත්තමනුරක්ඛෙ, එවම්පි සබ්බභූතෙසු මානසං භාවයෙ අපරිමාණං. මෙත්තඤ්ච සබ්බලොකස්මිං මානසං භාවයෙ අපරිමාණං, උද්ධං අධො ච තිරියඤ්ච අසම්බාධං අවෙරං අසපත්තං. තිට්ඨං චරං නිසින්නො වා සයානො වා යාවතස්ස විගතමිද්ධො, එතං සතිං අධිට්ඨෙය්‍ය බ්‍රහ්මමෙතං විහාරං ඉධමාහු. දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා දස්සනෙන සම්පන්නො, කාමෙසු විනෙය්‍ය ගෙධං නහි ජාතු ගබ්භසෙය්‍යං පුනරෙතීති.

කරණීයමෙත්තසුත්තං නිට්ඨිතං.

---

මහාකාරුණිකො නාථො හිතාය සබ්බපාණිනං, පූරෙත්වා පාරමී සබ්බා පත්තො සම්බොධිමුත්තමං, එතෙන සච්චවජ්ජෙන හොතු තෙ ජයමඞ්ගලං. ජයන්තො බොධියා මූලෙ සක්‍යානං නන්දිවඩ්ඪනො, එවං ත්වං විජයො හොතු ජයස්සු ජයමඞ්ගලං, සක්‍යාවො බුද්ධරතනං ඔසධං උත්තමං වරං, හිතං දෙවමනුස්සානං බුද්ධතෙජො

තේජෙන සොත්ථිනා, නස්සන්තුපද්දවා සබ්බෙ දුක්ඛා වූපසමෙන්තු තෙ. සක්කත්වා ධම්මරතනං ඔසධං උත්තමං වරං, පරිළාහූපසමනං ධම්මතේජෙන සොත්ථිනා, නස්සන්තුපද්දවා සබ්බෙ භයා වූපසමෙන්තු තෙ. සක්කත්වා සඞ්ඝරතනං ඔසධං උත්තමං වරං, ආහුනෙය්‍යං පාහුනෙය්‍යං සඞ්ඝතේජෙන සොත්ථිනා, නස්සන්තුපද්දවා සබ්බෙ රොගා වූපසමෙන්තු තෙ. යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධං පුථු, රතනං බුද්ධසමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ. යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධං පුථු, රතනං ධම්මසමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ. යං කිඤ්චි රතනං ලොකෙ විජ්ජති විවිධං පුථු, රතනං සඞ්ඝසමං නත්ථි තස්මා සොත්ථී භවන්තු තෙ. නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං, එතෙන සච්චවජ්ජෙන හොතු තෙ ජයමඞ්ගලං. නත්ථි මෙ සරණං අඤ්ඤං ධම්මො මෙ සරණං වරං, එතෙන සච්චවජ්ජෙන හොතු තෙ ජයමඞ්ගලං. නත්ථි මෙ සරණං අඤ්ඤං සඞ්ඝො මෙ සරණං වරං, එතෙන සච්චවජ්ජෙන හොතු තෙ ජයමඞ්ගලං. සබ්බීතියො විවජ්ජන්තු සබ්බරොගො විනස්සතු, මා තෙ භවත්වන්තරායො සුඛී දීඝායුකො භව. භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා, සබ්බබුද්ධානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ. භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා, සබ්බධම්මානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ. භවතු සබ්බමඞ්ගලං රක්ඛන්තු සබ්බදෙවතා, සබ්බසඞ්ඝානුභාවෙන සදා සොත්ථී භවන්තු තෙ. නක්ඛත්තයක්ඛභූතානං පාපග්ගහනිවාරණා, පරිත්තස්සානුභාවෙන හන්තු තෙසං උපද්දවෙ.

මහපිරිත්නිමි.

---

## ලිපිලිවීම.

1 වර්ෂය 2 මාසය 3 තිථිය 4 දිනය 5 නක්ෂත්‍රය යන මේ පඤ්චාංගය ලියා තිය යුතු.

ක්‍රිස්තු වර්ෂ. 1899 අප්‍රේල් මස 25 වෙනිදිනට ලිත ලියනවා නම් මෙසේය—

ශ්‍රී බුද්ධවර්ෂයෙන් දෙදහස්සාරසිය දෙසාලිසක්වූ මෙම වර්ෂයෙහි—බක්මස පුරපසළොස්වක් පිරි පෑලවිය නම් තිථිය ලත් අඟහරුවා ද මෙ දවසැ—

දින භාග දහඅටයි විනාඩි පණස්දෙකයි සානක්ත එකුන් විස්සයි විනාඩි දිසිපනයි.

තිථියලියන කල පූරඅවදෙකින් ලැබුනුයමක් ලියා එදිනට සම්බන්ධවූ තිථිදෙකක් ඇත්නම් ඒ තිථිදෙකම ලියනු—නක්ෂත ලියන කල්හිද එදිනට නක්ෂත්දෙකක් සම්බන්ධ නම් ඒ නක්ෂත් දෙකම පැය විනාඩිසහිතව වෙන්කරලියනු—වර්ෂය එක්පේළියකටත් තිථිය සහ දිනය එක්පේළියකටත් නක්ෂත එක්පේළියකටත් සිටින්ට පිළිවෙළින් තුන් පේළියට ලියයුතු.

## දෙවාලපත ලිවීම.

මාසය, තිථිය, දිනය, දෙවාලතල්පත් ගෙනගොස් ඔප්පුකරන ඉඩම සහ පිරිත් පවත්වන ඉඩමත් පිහිටි ජනපදය හෙවත් කෝරලය පත්තුව, දෙවාලයෙහිනම පිරිත්පවත්වන ඉඩමේ නම-දෙවාලය කොරෙන් පිරිත්පවත්වන ඉඩම පිහිටි දිශාව, ධාතූන් වැඩම්වූ බව සහ සංඝයා වහන්සේ රැස්ව බණපිරිත් සමහරකරණ වේලාව හෙවත් පෙරයම් රාත්‍රියෙහි බණ සමහරකරන බව—එසේ බණ සමහරකරන තැනට ධෘතරාෂ්ට්‍රාදි සතරවරම් දෙවිමහරජවරු ස පිරිවරින් සඞ්ඝාඥනුලලඞ්ඝණය කොට පැමිණිය යුතු බව යන ඒවි සියල්ල ලියනු—

ක්‍රමය දැනගැනීමට මහනුවරමල්වතුවිහාරයෙහි කරහලද බණපිරිත් පින්කමක දෙවාලපතක් මෙහි බහාලන්නෙමු.

බක්මස පුර පසලොස්වක් පිරි පැලවිය නම් තිථිය ලත් අඟහරුවාදා මෙ දවසැ—කටුපුළුල බද සෙඞ්කඩගල නාථදෙවාලයට දක්ෂිණදිශා භාගයෙහි වූ—පුෂ්පාරාමවිහාරාභ්‍යන්තරයෙහි උපොසථාගාරයටැ

බොහෝ ධාතුවරුන් වහන්සේත් ඩඩා මහසඞ්ඝයා වහන්සේත් රැස්ව පෙරයම් රාත්‍රියෙහි බණ සමහරකරන තැනටැ

ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතර වරම් දෙවි මහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සත් දූන්ටැ

සම්‍යක්තදෙවියනුත් උපවෙනෙහි දෙවියනුත් නො හැර කැඳවා ගෙන මඞ්ගලසූත්‍රාදි බණ අසනු පිණිස ඊමැ

සමග මහසඞ්ඝයා වහන්සේ සනව වදල මෙහෙවර සඞ්ඝාණන්නි හුගුණුවා ඉය යුතු.

දෙවාලපත ලියන කල පළමුවෙනි පිට පේළි තුණකාටත් දෙවෙනි පිට පේළි දෙකකාටත් ලියනු- පළමුවෙනි පිටේ පේලි තුනේ අග අකුරු තුණ හෙවත් මැ ඝනු තුණ එක එල්ලේ ලියනු—එසේම දෙවෙනි පිටේ පේලි දෙකේ අන්තිම අකුරු දෙක හෙවත් මැ ගන්න සහ තු ගන්නත් එක එල්ලේම ලියනු

ලිත සහ දෙවාලපත නිමි.

# විහාරඅස්න.

වෙසක්මස පුර සැටවක් පිරි සතවක් නම් තිථිය ලත් බදාදාවේ දවස—කුවුපුලුල බද සෙංකඩගල නාථදෙවාලයට දක්‍ෂිණදිශාභාගයෙහිවූ—පුෂ්පාරාමවිහාරාභ්‍යන්තරයෙහි උපෝෂථාගාරයට—බොහෝ ධාතුවරුන් වහන්සේත් වඩා මහසඞ්ඝයා වහන්සේත් රැස්ව පෙරයම්රාත්‍රියෙහි බණසමහරකරන තැනට—

සගම පස්නම අරත්තන මාදන්වල විල්වල කඩදොර මොරපාය දිඹුල පුසුල්පිටිය නියංගම්පායස්ථානය. විල්වාසගොඩ සැලව අමර මැදිලිය දිප්පිටිය බම්පණේ කාරියගම ගල්ලෑල්ල අලුත්නුවර පරණනුවර මාවෙල මාකඩවර හිතුල කප්පාගොඩ. පදිදොර උතුරාවල අම්බුලුගල දනගිරිගල වාගිරිගල ලෙනගල අලවතුර වතුර මාකුරාව. කවුඩුගම බිසෝවෙල දෑදිගම අරන්දොර දොරවක මඩබඩිවිට තොටගෙදර මදුරුපිටිය අත්තනගල්ල උරුවෙල ගොඩගෙදර දොරණගොඩ. යටවත්ත රාගම මීගමුව දඹදෙනිය බෙලිගල නවගමුව බමුණුගම වට්ටාරම වතුදෙණිය පුනුරිගල්බොඩගම තොල්ගුර ඔකදපොල උඩපොල අල්ගම නවකොළගමුව ඇත්කඳවිහාරය. කුරුණෑගල කුරුවෙණිසාගල ආදනල ඉඩිබාගල යක්දෙස්ගල නාථගම සංවැල්ල කඩිකාව මලගනේ කබල්ලෑමලන හිඳවනේ නාගලවිහාරය. රුස්වේරුව තලංගමුව පෙරියකඩුව දෙවගිරිවිහාරය. සංගමුවිහාරය උතුරුපව්විහාරය බුජස්ලෙන ගාමිලෙන ජයකඩුලෙන සැගෑලෙන කුඹුරුලෙන රිදීලෙන රම්බඩගල්ල දෙල්වට විල්ගම අස්ගිරිය රුසීගම ඇම්බැක්ක දිලිලව,නය බඹාවිහාරය. රංගිරිදඹුල්ල සීගිරිය කලාවැව බලලපාව අනුරාධපුරයෙහි ශ්‍රීමහාබෝධීන්වහන්සේය. ලෝවාමහාප්‍රාසාදස්ථානය මිරිසවැටිවිහාරය අභයගිරිවිහාරය. දෙනෑනකාය ඍගිරිනකාය රත්නමාලිචෛත්‍යය ථූපාරාමචෛත්‍යය මිහින්තලේ අම්බස්ථලනා නීතුපත්පාන සුරුලුම්හමුණිසාව මුන්නේස්සරම ඇත්තල මස්කම මන්නාරම මාන්තෝට්ටම පොන්පරප්පුව

මල්විල දෙමළපට්ටනමහිනාගකෝවිල. කඳුරුගොඩවිහාරය.
ඉතල්පොල මිල්ලගම මීවන්ගමුවිහාරය හන්තිදිවසින අග්නිදිව
සින නාගදිවසින පුවඟුදිවසින කාරදිවසින මොල්ලියාවල නිරිකු
නාමලය ඩිල්ගම්වෙහෙර තිස්සමහාවෙහෙර ඉලන්දගොඩ කඳුරු
කෝට්ටෙහි ඇතුබද්ද ලඞ්කාතිලකය ගඩලාදෙණිය විජයෝත්
පාය අභයගිරිවිහාරය. ජේතවනවිහාරය කපිලවිහාරය ඉසිපත
නාරාමය කුසිනාරාමය පූර්වාරාමය දක්ෂිණාරාමය පශ්චිමාරාමය
උත්තරාරාමය සළුමිණිසෑය සිළුමිණිසෑය දෙමිළමහසෑය පොළො
න්නරුවිහාරය. සුලුන්නරුවිහාරය සිතුල්පව්වහාරය ධනංජයවි
හාරය කුකුලුවාවිහාරය දිඹුලාගල්විහාරය. තබාවෙහෙර මිහුගු
ණාවෙහෙර සොලොන්නාතොට බදුලුවෙහෙර ප්‍රධානනාපිටිය රුනු
ණුබද කතරගම උග්ගල්අලුත්නුවර තඹගමුව මුල්ගිරිය ඕවාගිරි
විහාරය. දෙවිනුවරයෙහිදිව්‍යරාජභවනය ඔත්පිළිමගෙය සිටපිළි
මගෙය ගල්ගණේ වැලිගම අග්‍රබෝධිවිහාරය පරගොඩවිහාරය
තොටගමුවිහාරය ගලපාතවිහාරය බොධිමලුවිහාරය වනවාසවිහා
රය. බෙන්තෙවෙහෙර බෙන්තොට කළුතොට සොරණ චිඩිදූගම
කොතලාවල රඹුක්කන පානදුරේදේවාලය. බෙල්ලන්විල පැපිළි
යාන නාවින්න විජයාරාමය සුභද්‍රාරාමය ජයවර්ධනකෝට්ටෙහි
පිළිමගෙය සමිඹුබදෙවාලය කිත්සිරිමෙවන්කැලණිය රජමහකැල
ණිය විභීෂණදේවාලය. වැලිවිට බොල්ලතානල සේවාගම දිසාප
තිනුගෙය කඩුදෙවොල බෝමීරිය සංවැල්ල කෙහෙල්බටුවාව අතු
රුගිරිවිහාරය. දෙහිගමුව දෙල්ගමුව බටුගෙදර දෙනවක සපරග
මුව ගිලිමලය සමන්තකූටපර්වතය දිවාගුහාව බලංගොල සිදගල
කළුගමුව ගඩිනාතිලකවිහාරය. කුඹල්ඔළුව අලුදෙණිය කොටකේ
දෙණිය ඉලුපැන්දෙණිය සේන්දෙණිය හිඟගම්මන අරත්තන
හන්තානගොඩ වේගිරිය ඇම්බැක්ක ලඞ්කාතිලකය වටදාගෙය.
ගඩලාදෙණිය දූලිවෙල ගඟුල්දෙණිය උරුලෑවත්ත කොටබෝගො
ඩ රංමුංගොඩ ගදල්දෙණිය මැණික්දිවෙල මොණරගොඩ කොළ
තල වල්ගම්පාය දන්තොටවතුර සිලඹිලාගොඩ. දෙඩංවෙල දිග
කොල්හාවෙල සූරියගොඩ කොබ්බෑකඩුව ගන්නොරුව කුළුගම්ම
න මාලගම්මන අත්තරගම මැදවෙල ගල්ලෑල්ල දෙලපිල්ල අලව
තුගොඩ කොහොණ ඩිඹිබටුවාව ඇඹිල්ලවිහාරය ආලෝකවිහාර
ය. කුරුවාබෝගම්බර කඩුවෙල දුනුවිල ඇඹෙල නිත්තවෙල සි
රිමල්වත්ත අඹුණුගම ගඩිගාරාමවිහාරය. සෙංකඩගල අලුත්වි
හාරය පරණවිහාරය නානවිමාණය උපෝසථාරාමය ශ්‍රීදංෂ්ට්‍රාදළ
දාමන්දිරය.

* ඇතුළුවූ සියලු විහාරදේවාලවල අධිගෘහිතදේවිම්භරජාණන් ත
මුන් තමන්ගේ සහායපිරිවර දෙවියනුත් සන්දෘෂ්ට-සම්භක්ත
දෙවියනුත් උපදෙවතාකි දෙවියනුත් අනාගාරිකාදේවාංගනාවන් මඩිග
ලසුත්‍රාදී බණඅසනු පිණිස ඒම — සමගම මහසඞ්ඝයා වහන්සේට අ
භිමතදේ අභිමතදේ අභිමතදේ අභිමතයි අභිමතයි අභිමතයි —
සමග මහසඞ්ඝයා වහන්සේ සගාවවදාල මෙනෙවර සඞ්ඝාණනාහි
ය තුනුලුවා ඉඳ යුතුයි.

විහාරඅස්න නිමි.

# දෙරකඩඅස්න.

ශෝෂිලතාදි අමිතගුණගණාඞ්ගයෙන් උපලක්ෂිතවූ පිත්වත්
සවාමීන්වහන්ස විචිත්‍රවර්ණෝපශෝභිතවූ මෙම මණ්ඩපචාරයෙහි
මිනිස්සු ඇති — අනේකබලපරාක්‍රමප්‍රතාපාලඞ්කෘතවූ සුරේන්ද්‍රාරාධ
නාවට ගියාවූ දෙවදූතයාවන මම මෙහි අවුත් සිටිනෙමි.

සවසන් ශ්‍රීකරමනෝරම්‍යකානකගිරිශෘඞ්ගතුඞ්ගාලඞ්කාර ලඞ්කා
පුරප්‍රවරාධිශ්වර — වෛවස්වතමනුවංශශ්‍රීමහාසම්මත මහාරාජාධිරා
ජෝත්තම — වරවංශාභිජාත ලක්ෂණසම්පූර්ණ මහීරක්ෂණදක්ෂ ස්ව
ර්ණවරසිංහාසනාරූඪ — අඞ්ග වඞ්ග කාලිඞ්ග තෙලිඞ්ග බඞ්ගාල ප
රඞ්ගි මලයාළ කර්ණාට ගුජ්ජරාදි පරමණ්ඩලේශ්වර — ගජ තුරග කා
නක මණි භූෂණ දිව්‍යාම්බර ස්වර්ණශිවිකාදි නානාප්‍රකාරභාග
ධෙයානීත — රාජබෘන්ද නන්දිතෝපතුඞ්ග මකරතොරණ මහාවාර
රාජිත නිත්‍ය සත්‍යධර්මප්‍රවෘත්ත — සුරරාජසම්භොග කරරාජඉව
තෙජ ගිරිරාජදෘඪවීර රිපුරාජගජහාරකෘතභීත — මෘගරාජනිහරා
ජ කවිභොජ නරධීර මහරාජ මනුරාජ කුලරාජ යසබීජ භූමිවා
ප — තෘපදීප සරචාප ධරසුර බහුකොප රණචාර ජනතාප සක
ලාප සිවිචාග උපමාන සසිමාන — සිරිසාර මෘතසාර ඝනසාර න
රලොකපුරන්දර පරරාජභයඞ්කර වීරරාජජයඞ්කර සිරිධාරභුජන්ද
ර භූලොකපුරන්දර — දිනේශ්වර කුලේශ්වර ගජේශ්වර හයේශ්වර
ජනේශ්වර රාජපරමේශ්වරවූ — සකල ලොකදශදිශාබාහ්‍යාභ්‍යන්තරයෙ
හි පතලාවූ ඝන බහල රිපු තිමිර හරණ නිකර විධ්වංසනය කි
රිමෙන් — අරුණතරුණකිරණප්‍රභාමණ්ඩිත ප්‍රාදුර්භූත සූර්‍ය්‍යදි
ව්‍යරාජයා මෙන් — ශ්‍රීලඞ්කාද්වීපයෙහි නානාවිධ ශත්‍රුඅන්ධකාරසමූ
හ දුරීභූතකොටමින් ලොකශාසනාභිවෘද්ධිවර්ධනයකිරීම සඳහා —
ඉන්ද්‍රොපෙන්ද්‍රචන්ද්‍රශෙඛරප්‍රජාපත්‍යාදි දිව්‍යරාජසමූහයා විසින් — සකල

* දේවාලයේ නම මෙතනට යොදාගත යුතු.

ලප්‍රත්‍යසමිතාරයෙන් නිර්මිතකොටිසිතුවිණිරූපිතක් මෙන් ප්‍රකා ශකරන ලද්දාවූ—අපගේ දිපවංකුමාරසිංහයාවිශ් වහන්සේගේ අභි ලොකපූජිත ප්‍රශස්ත ශශිවංශාභ්‍යුදය රාජ්‍යශ්‍රී ප්‍රඥාරූපානුප්‍රසන්න ආයුවක්‍රය පැවැත්තාවූ—සමීපරාජ්‍යප්‍රසූදිත ලලාටාංශලග්න භගාන්ත රමොමට ඇසී සුප්‍රසිද්ධසිංහකර්ණපුගම්යයක් බදුවූ—රුහුණු මායා පිහිටිරටය යන ත්‍රිසිංහලාධිරාජ්‍යරාජ්‍යයෙන් මායාරටට අන්‍යාගිභූත වූ—මෙම පින්කමට ඇතුලත් දුශ්කම්බුලිකකාරකාදි සකල ශ්‍රද්ධාව න්තසත්පුරුෂජනයන්ට—අරිෂ්ටදර්ශනීය දින්දූන උල්කා ර ධිරාකා ර ධූමකෙතු වක්‍රාතුවක්‍ර ග්‍රහඝට්ටන භූමිකම්පා—ශාඩම්භිත පරි වෙෂ * රක්තාභ්‍රහු ප්‍රාකාරගොපුරවාරපතනී වෘක්ෂවාපිවෙළපුරහදු දිවාතුරඟසුනි නිශාකාකාරව—ප්‍රවෙශමශ්‍රූන සෙවිතමශ්‍රූ දදර්ශන මෘගනරප්‍රසූත ශවාතඝනාලම්බකාරවාකාරාසිරව— අකාලපුෂ්පඵ ල කපෝත උලූක නාග මෙන පක්ෂි ඇටිකුට ගොබෝ ඩෙබර ගෘහ ප්‍රවෙශ—තෙල්වේතුඹස් ගෙරිකුරුපහර සමුද්‍රජුලම්බඝන ජදනා ගමන සුනඛබිලාලකලහ කාකමෛථුනදර්ශන නිශාභූසුවාප—කකු නගොචරග්‍රහණ පක්ෂබිග්‍රෙවෙකාසි පාංශුවර්ෂාදි භූමිරම්භ විකාර මහ ගෘහාරම්භ ප්‍රාකාරබන්ධනාදීයෙන් සඤ්ජාතවූද නොහොත්— මෙම පින්කමකරවීමට ඇතුලත් දුශ්කම්බුලිකකාරකාදි සකල ශ්‍රද්ධා වන්තසත්පුරුෂජනයන්ගේ—බාහ්‍යාභ්‍යන්තරොත්පන්න දුස්වප්න දුර්නිමිත්ත කලිකලහ වෛකල්‍යවිග්‍රහවිවාදාදීන් වන්නාවූ—අෂ්ටා නීරෙකනවුතිසංඛ්‍යාතරොගයෙන්හා නවානීරෙකනවුතිසංඛ්‍යාත ව්‍යාධියෙන්හා—සංවත්සර ඍතුපරිවර්තනොපක්‍රම ජනමනොක්‍රා ධිපතිග්‍රහදූෂණාදි සකලානතරාය සව්‍යාපද්‍රවනිවාරණය කොට— කීර්ති තාරහාර තුෂාර කලහාර ක්ෂීර සමවිත ක්ෂීරාර්ණවාකාර— අරුණකරකිරණසපුරණතරුණාරුණ ප්‍රවාලාඞ්කුර ප්‍රවාලාංශිව† සුරභිසුරතුරු හඳුසට නවනිධීන් සාදුසැවූ සකලෛලශවනිබිම වර්තනය කරනු පිණිස—ධෘතරාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතරවරම්දෙවිම්හරජදරුවන් ඇතුළුවූ සැම දෙවියෝම සහ පිරිවරින් වැඩිසේක.

**දෙරකඩඅස්න නිමි.**

---

* පරිවෙෂන, යනු වැරදිමකි.

† ප්‍රවාලාංශීවර්ණ, යනු වැරදිමකැයි හැඟේ.

# අනුශාසනාව.

මෙ තැන්හි රැස්වූ දෙවියන්ට පඬුරු පිණිස,

සුප්‍රතිපන්න සෘජුභාවාදි රඤ්ජිත පොෂිත ශීලස්කන්ධ ගුණ ප්‍රභාපාලඞ්කෘත—ශ්‍රීනිකෙත වරචාරුදෙහශ්‍රීසාරවිරාජිත දූරීකෘතාශෙෂඥානාන්ධකාරප්‍රකීර්ණ නෛකගුණගණානුභාවොත්පන්නමහාසඞ්ඝයා වහන්සේ—ස්වර්ගමර්ත්‍යපාතාලසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසී සමස්තසත්වහිතාභිවෘද්ධිය පිණිස—බාලජනසංසර්ග විරහිතව අඛණ්ඩනාචාරමණ්ඩිත පණ්ඩිත්ජන භජන සෙවන පර්යුපාසණ සම්භාෂණාදිවූ අටතිසක් මඞ්ගල්‍යකථාවන් කරණකොට ගෙන—අනල්පකාලපාපචිත කුශලබල සමුද්භව දශබල චතුර්වෛශාරද්‍යඥානාදි ගුණගණමණිමයූඛප්‍රසරවිස්ඵුරිතාමිත ධර්මකායසම්පත්තීන් විශුද්ධවූ—ත්‍රිභුවනෛකතිලක සකලඥෙයසාගරපාරගතානෙකගුණරත්නම්භීරාශෙෂජනවන්දනීය මකුටමණිමරීචිකදම්බචුම්බිතවරචරණනඛකිරණශ්‍රෙණීන් විරාජමානවූ--සම්‍යක්සම්බුද්ධසර්වඥරාජොත්තමයාණන් වහන්සේ විසින්—මධුමදමුදිතලලිතාරතිකරමනොහරකුරවිකනාදනිර්විශෙෂාෂ්ටාඞ්ගසමුපෙතමධුරස්වරයෙන් දෙශනාකරන ලද—අඥජනසංසර්ගාපගමාදි අෂ්ටොත්තර ත්‍රිංශත් ප්‍රභෙද මඞ්ගල්‍යලක්ෂණයෙන් උපලක්ෂිතවූ ධර්මාමෘතදෙශනාප්‍රතිවෙධගම්භීර සුරමනුජ සුරාසුරොරගශ්‍රවණජනමනකර්ණරසායනවූ—මේ මඞ්ගලසූත්‍රය ගණසජ්ඣායනා කොට වදාළ සේක—එහි පින් අනුමොදන් විය යුත්තේය. මෙම පින්කම කරවීමට ප්‍රධානාප්‍රධානසකලසත්පුරුෂසාධුජනයන් විසින්—සත් දවසක් මුලුල්ලෙහි දුර්වාරසපරිවාරඝොරමාරාස්භිහඞ්කාරනිර්වාපණෛකදක්ෂ යක්ෂ රාක්ෂස ගරුඩ ගන්ධර්ව සිද්ධ විද්‍යාධර මෞලිමණිමාලාලඞ්කෘත—අඞ්ඝ්‍රිපද්මයක් ඇති බුද්ධාදි රත්නත්‍රයවිෂයෙහි පවත්වන ලද—දීපපූජා ධූපපූජා පුෂ්පපූජා සුගන්ධපූජා වන්දන මානනාදි සත්කාරකරණයෙන් ජනිතවූ පින් අනුමොදන් විය යුත්තේය. ශීල සමාධි ප්‍රඥා විමුක්ති විමුක්තිඥානාද්‍යනෙකගුණභූෂණභූෂිතාශෙෂවිෂධරොරගගරුඩගණසදෘශ මාරවීරතිමිරනිධනදිවාකරාකාර චාරුතරශ්‍රීසාරවිරාජිත—ශ්‍රීඝන සකලශාසනොද්‍යකාරීශාරිපුත්‍රමෞද්ගල්‍යායනාස්ථවිරාවශාගත——— විශුද්ධප්‍රාතිමොක්ෂශීලසංසිද්ධ්‍යසිද්ධගුණප්‍රශස්ත මහාසඞ්ඝයාවහන්සේ විෂයෙහි පවත්වන ලද—ආවාසදාන ආසනදාන ප්‍රත්‍යයදාන තාම්බූලදාන කප්පූරදාන අඤ්ජලිකර්ම සාමීචිකර්මාදියෙන්,ජනිතවූ පින් අනුමොදන්විය යුත්තේය. ශක්‍ර බ්‍රහ්ම විෂ්ණු මහෙශ්වර සුයාම ස

නාතුෂිතාදි කාමාවචරරූපාවචරදිව්‍යරාජයන් විසින්ද එහි පින් අනුමෝදන්විය යුත්තේය. නෛකවිධමණිශිඛරවිනිර්ගත අමෘතකරකිරණනිභ හිමපටලප්‍රකම්පිතශිශිරසීකරවාරිපූරිතනිර්ඣරාකුලගිරිනිර්ඣරනීරධාරාලඞ්කෘත—මෙරු යුගන්ධර ඊෂාධර කරවීක සුදර්ශන නෙමින්ධර විනතකාශ්වකර්ණ කෛලාස වින්ධ්‍ය ගන්ධමාදන මිඝාචල මලයාදි පර්වතවාසී දිව්‍යසමූහයා විසින්ද එහිපින්—පෙ. අන්තරීක්ෂවිමානයෙහි වාසයකරණ රවි චන්ද්‍ර කුජ බුධ ගුරු ශුක්‍ර ශනි රාහු කෙතුය යන නවග්‍රහයන් විසින් ද එහි පින්—පෙ. අශ්විනාදි නක්ෂත්‍රතාරකාවන්ට අධිපතිවූ. දෙව දෛත්‍යාදි සප්තවිංශතිනක්ෂත්‍රදෙවතාවන් විසින්ද එහි පින්—පෙ.. මේ ශ්‍රීලඞ්කාවීපයෙහි අධිගෘහීත බදිරදෙහලිවංශෝද්භූත උත්පලවර්ණ සුමනකාර්තිකෙය විභීෂණ සංඛ්‍යාත සතරදෙවාලයෙහි දෙවිමහරජදරුවන් විසින්ද එහි පින්—පෙ. මහීවරවඩ්දරනාභිමණ්ඩලාකාර ප්‍රසන්න කාජධගල සලලවහී සේවතකණ්ණිකා ධූන උසීරධ්වජාභිධානපයස්ගෝනාපරිච්ඡේදනිමිත්තභූත නදී ග්‍රාම නිගම ප්‍රතිමණ්ඩිතමධ්‍යදෙශයෙහිවූ—පාණ්ඩව ගිජ්ඣකූට ඉසිගිලි වේභාර වේපුල්ල පර්වතාදියෙහි අධිගෘහිතදෙවතාවන් විසින්ද එහි පින්—පෙ. ඉන්ද්‍ර යමාග්නි නෛරෘති වාරුණාදි අෂ්ටදික්පාලයන් විසීන්ද එහි පින්—පෙ. ඉන්ද්‍ර සොම වරුණ භාරමාජ ප්‍රජාපත්‍යාදි අෂ්ටවිංශතියක්ෂසෙනාධිපතීන් විසින්ද එහි පින්—පෙ. ආදිත්‍ය වසු වස්වාදිවූ ගණදෙවතාවන් විසින්ද එහි පින්—පෙ. පුෂ්පදන්තනාරුවස්‍ය කුවෙර මණිභද්‍රාදී භූතගණයා විසින්ද එහි පින්—පෙ. සියලු බොධිවෘක්ෂචෛත්‍ය පතිමාගෘහ ග්‍රාමාරාම විහාර නගරාරන්‍ය තරු වන සර සරිත් සාගර විමානාදියෙහි අධිගෘහීතදෙවතාවන් විසින්ද එහි පින්—පෙ. කර්ණාට ලලාට කාශ්මීර කාම්බොජ කම්පිල්ල භරුකච්ඡ නෙපාල සබර බබ්බර ගුජ්ජර චීන මහාචීන—ගාන්ධාර ජලධාර මොධාර සිරිරඨ කුරුරඨ මහරඨ වගුරඨ සොනහත පුරතනාපතනුගත කල්‍යාණ තුරාන මිකීනටානන හොටානන මහාහොටානන්තු—ගයා භෘඞ්ග අඞ්ග වඞ්ග තුඞ්ග තුරඞ්ග කඹග කොඞ්ග කාලිඞ්ග කෙලිඞ්ග ලාඩ ගෞඩ ද්‍රවිඩ ඔඩ්ඩි වඩ්ඩ පාරසී කොශි උරුමුසි කාරල කෙරල නෙපාල මලයාල බඞ්ගාල—රොජ විරරොජ ප්‍රතිකාල් අරමන මලලව තෝඞ පාඞි මණ්ඩල කාවේරි කායල සිල්ලමාදී සර්වදෙසාධිගෘහීතදෙවතාවන් විසින්ද එහි පින්—පෙ. වටවිටපතිසලසාලඞ්කෘතායතන න්‍යග්‍රොධාශ්වත්ථ * වකුල පාටලාශොකා

* න්‍යග්‍රොධාශ්වත්ථ, යනු මැරදිවයවිහාරයකි.

සලල ශාල සල්ලකී පලලව නීතම්බ නිම්බ ජම්බීර ජම්බුදුම්බර කද ම්බාදී තරුවිතානඝනකානන අධිගතගීතදේවතාවන් විසින්ද එහි පින් -පෙ. හිමවා සරාවෙයි සිඳු ව්‍යඥනාග ගම්භීර නම්මදාදිවූ ගඞ්ගා වෙසී අධිගතගිනු දෙවතාවන් විසින්ද එහි පින්—පෙ. දුබලපවන බලලුලිතකිසලයානනසහනසහඥන චෙගමිදදිජමීර පිණ්ඩමණ්ඩිත වරාඩිමිශ්‍රාභස්මාඩාබරාඩ නිෂ්චිත මුරාරිනදීඔමුබ විදශ්‍රුතප්‍රාය කාලෙලා ලම්බාලාසමුල්ලසිත—චෙලාතටනිකට ශ්‍රීකන්මුක්තාප්‍රවාල උත්තුඞ්ගත රඞ්ගාභිරාම චතුස්සාගර සංරක්ෂණයෙහි නියුක්ත ක්‍රමොන්නාත නී ම්බද්‍රූනාකාර භුජඞ්ගබන්ධන් හා—හාවභාවලීලාකටාක්ෂප්‍රම්ගීයාන න යනාභිරාමදුකූලහංස සම්පූර්ණරූපලාවණ්‍යාදිවිශේෂසම්පත්තීන් යුක්ත වූ මණිමෙඛලා නම් දිව්‍යාඞ්ගනාව විසින්ද එහි පින්—පෙ. නෙම සිංහාසනාසින දක්ෂිණාකාර සාහිත සනත්කුමාරාභිරාමවූ ශ්‍රීකාන්තා ව විසින්ද එහි පින්—පෙ. සුගන්ධිමන්දාරපුෂ්පමණ්ඩපපුෂ්පපරිත මහාතාලිතිකාරනිෂෙවිත විචිත්‍රසහප්‍රාසාදාරූඪවූ සරස්වතී දිව්‍යා ඞ්ගනාව විසින්ද එහි පින්—පෙ. අසුරපුරාධීශ්වරවූ වෙපචිත්තාදී අසුරේන්ද්‍රයන් විසින්ද එහි පින්—පෙ. උරගපුරාධීශ්වරවූ මණිකා නකාත්‍රිකූටප්‍රතිමණ්ඩිත සඞ්ඛපාල මහාකාලාදී නාගේන්ද්‍රයන් විසින්ද එහි පින්—පෙ. ජල තල වෘක්ෂ පර්වත විමානාවභාසප්‍රසුවර්ණජ්වලන මිහිර කන්දරාන්තර නිශාචරනිකුඤ්ජ නිර්ඣර ප්‍රපාතගිරිශිඛර සිඳුප දම්තරාදීන් වාසස්ථාන කොට ඇති දෙවසමූහයා විසින්ද එහි පින්—පෙ.

මෙසේ නරෝත්තමවූ මේ සියලුම පින් අනුමෝදන්ව අධිකතරස ම්පත්තීන් සමෘද්ධවූ දිව්‍යසමූහයා විසින්—මේ පින්කම කරවීමට ඇ තුල්හ්ත් දයකාරකාදීන්ට අමනොඥ අසහ්‍යතුෂ්ටිදුෂ්ටාරිෂ්ටඅමනුෂ්‍ය භයාදීන් ඇත්නම්—ඔවුන්ට අවවාදනුශාසනා කොට අවවාදක්ෂ ම වූනම් ශීඝ්‍රසුඛකරණප්‍රවිෂ්ටෙහිසාධුභාවයෙහි පිහිටුවා කායික මා නසික ව්‍යසනාපහත—තිථි කාරණ හෝරා මුහූර්ත නවග්‍රහාදී පීඩා සංහිඳුවා ආතුරාවරෝගයාදී සකලෝපද්‍රවහිංසාවිබාධනය කටයුත් තේය. එසේත් අවවාදක්ෂම නොවන්නාවූ සහබාධපරිතාධකස යෙන් යුක්තවූ අමනුෂ්‍යයෙක් වූනම්—චතුර්දිසාධිපතිවූ ධෘත රාෂ්ට්‍ර විරූඪ විරූපාක්ෂ වෛශ්‍රවණය යන සතර යක්ෂ රාක්ෂසාධිප ති සතරවරම් දෙවිමහරජදරුවන් විසින්—භික්ෂු භික්ෂුණ්‍යාදිවූ සිවු වනක් පාරිෂදයන්ගේ ගොපන රක්ෂාවරණ අවිහිංසා පාසුවිහර ණය පිණිස මහාකාරුණිකයානන් දෙශනාකරන ලද්දවූ—සකල සංවිජිතවිශ්‍රාන්ත ඉමබුතී ඇති නෙහාබාදීගතූමිගත්වෙඩිදගිනක

සරිභූත මාරවීරසර්වඥරාජජනනම්සාණන්වහන්සේ විසින්—සප්ත රත්නප්‍රාකාරගොපුරපරිඛාපරික්ෂිප්තරත්නාවරණයෙන් යුක්තාවූ රාජගෘහනගරවරාසන්නායෙහි වූ ගිජ්ඣවිහඟාකාරකූටාලඞ්කෘත යෙසින් ගිජ්ඣකූට නම් වූ පර්වතමස්තකයෙහි සන්ධ්‍යාවලාප්‍රභාරඤ්ජිත ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා පරික්ෂිප්ත තරුණරවිකිරණකනකගිරිශිඛරයක් සේ අභිනවානෙකාපමෙයවූ ප්‍රභාපන්නවරබුද්ධාසනාරූඪව වැඩහිඳ දෙශනාකරන ලද්දාවූ—කොටිසතසහස්‍රචක්‍රවාටවාසී යක්ෂ රාක්ෂ ඝොරග ගරුඩ ගන්ධර්ව සිද්ධ භූත ප්‍රෙත පිසාචාදීන් විසින් අවිලඞ්ඝනීයවූ ආඥා ඇති මේ ආටානාටිය සූත්‍රාන්තධර්මදෙශනාව මේ වැඩවුන් දෙසෙදනාවහන්සේ ඇතුළුවූ මහාසඞ්ඝයාවහන්සේලවා පිරුවාවන සේක—තුන්සම්රාත්‍රිය මුලුල්ලෙහි සජ්ඣායනාෂමොපසම්පාදීන් සිට බණ අසා ශාසනෝපකාරිවූ රත්නත්‍රයසරණපරායණ සකලසත්පුරුෂසාධුජනයන්ට—සෘතුපරිවර්තනොපක්‍රම සුපසුප්‍රතිපක්ෂ යක්ෂ රාක්ෂස තරක්ෂ ව්‍යාඝ්‍රාක්ෂ මකරාක්ෂ මහිෂ මෙෂාදිවිශේෂපද්‍රව * ග්‍රහසංක්‍රාන්ති දුස්සප්න දුර්නිමිත්ත කල්කලහ වෛවසල්‍ය විග්‍රහ විවාදාදීන් වන්නාවූ සකලානර්ථ සර්වොපද්‍රව නිවාරණය කොට—කීර්ති තාරහාර තුෂාර කල්හාර ක්ෂීර සඵටික ක්ෂීරාර්ණවාකාර—අරුණකරකිරණාඞ්කුරණතරුණාරුණනුව ලඞ්කුර ප්‍රවාලාණිව † සුරහිසුරතුරු ගඳකට නමාධින් සාදානවූ සකලෙලසව යසංශිවෘද්ධිවර්ධිතය කටයුතු.

අනුශාසනාව නිමි.

---

* මෙසාඛිපීසාපද්‍රව, යි කිවද මැනවි. මෙයාසිරවිසාපද්‍රව, යි සීම අවිසකතාවනුපහාරයි

† ප්‍රවාලාඞ්කවණ්, යනු වැරදීමකැයි හැඟේ.

# දැන්වීමයි.

මෙහි වන්නාහි බණආරාධනා සහ පිරිත්ආරාධනාව මහපිරිත පිරිත්පේකිරීම ලිත සහ දෙවාලපත ලියනක්‍රමය විහාරඅස්න දෛරකඩඅස්න අනුශාසනාව යන මේ සියල්ල ඇතුලත් කරන ලදී.

## බණආරාධනා කියන විධිය නම්.

ආසනාරූඪවූ ධර්මකථිකයන් වහන්සේලාට වැඳ අවසර ගෙන මෙහි දක්වූ 1, 2, 3, ඉලක්කම් දරන එලුසොලෝවලින් පංසිල් ඉල්වා නමස්කාර පාඨය තෙවරක් කියා පංසිල් සමාදන්ව 4, 5, 6 7, 8, 9, 10, 11, ඉලක්කම් දරන සොලෝ සහ "ශ්‍රීමත් මධුරොදර" යනාදි චූර්ණිකාවද කියා එහි කෙලවරට 15 වෙනි සොලෝව පටන් 22 වෙනි සොලෝවද දක්වා කියා නිමකරනු. බණකීම එක ආසනේ නම් 9, 10, 11, සොලෝ නොකියා හරිනු. දෙවෙනි බණආරාධනාවෙහිද 12 වැන්නෙන් පංසිල් ඉල්ලීමද 13, 14, වෙනි සොලෝ සහ "සචකති" යනාදි චූර්ණිකාව කියා එහිද කෙලවරට 15 වෙනි සොලෝව පටන් 22 වෙනි සොලෝව දක්වා කියා නිමකිරීම දතයුතුයි.

## පිරිත්විධිය නම්.

මහසංඝයා වහන්සේ පිරිත්මණ්ඩපයට රැස්ව වැඩහිඳ පිරිසට පංසිල්දී සැමදෙනා වහන්සේම විජිනිපත් බනාතබා ඇඳිලි බැඳගෙන නමස්කාරපාඨයකියා පටිච්චසමුප්පාදයද "අනෙකජාතිසංසාරං" යනාදි ගාථා දෙකද "ඉතිපි සො භගවා" යනාදි ගාථා තුණද ජය මංගලගාථා නවයද "භවතු සබ්බමංගලං" යනාදි ගාථා තුණද "නක්ඛත්තයක්ඛභූතානං" යනාදි ගාථාවද යන මේ සියල්ල බැණ නිමවනු. මීට අනතුරුව මංගල්‍යභෙරිවාදනයෙන් පසු විජිනිපත් අතටගෙන කරණීයමෙත්තසූත්‍රයද රතනසූත්‍රයෙන් "යං කිඤ්චි විත්තං" යනාදි ගාථාව පටන් "ඛීණං පුරාණං" යනාදි ගාථාවේ කෙලවර දක්වාද "යං දුන්නිමිත්තං" යනාදි ගාථා තුණද "දුක්ඛප්පත්තා ච නිද්දුක්ඛා" යනාදි ගාථාවද "සබ්බෙ බුද්ධා" යනාදි ගාථාවද පිළිවෙළින් බැණ නිමවා තබනු. සතියක් මුලුල්ලෙහි බණපිරිත් පවත්වන භික්ෂූන් වහන්සේලා විසින් මෙසේ සවස පිරිත පේකර තබා එම රාත්‍රියෙහි අරුණට පලමුව පිරිත්මණ්ඩපයට රැස්ව "විපත්ති පටිබාහාය" යනාදීන් පිරිතට ආරාධනා කරනු ලදුව දෙනමක් වැඩහිඳ නමස්කාරපාඨය කියා සරණාගමනය ආදි කොට දස

ධම්මසුත්‍රය කෙළවරකොට බැණ නිමවූකල්හි සැමදෙනා වහන්සේ විසින්ම මහපිරිත කියා නිමකරනු. ඉක්බිති දෙනමක් වැඩහිඳ මංගලාෂ්ටභේරිවාදනයෙන් පසු මංගලසූත්‍රය ආදි කොට පළමු වෙනි බණවර කියා කෙළවර කරනු. එතැන් පටන් පිරිත්පුග සහ දවස තුන් වේලේ මහපිරිතද නො කඩව පවත්වනු.

සූත්‍ර කියන දවසෙහි පළමු සැරසිලි හැර අමුතු සැරසිලි කටයුතුයි. මෙම දින සවස මහසංඝයා වහන්සේ මණ්ඩපයට රැස්ව මහ පිරිත කියා දෙනමක් වැඩහිඳ පන්සිල් දී මංගලාෂ්ටභේරිවාදනයෙන් පසු නමස්කාරපාඨය සහ සරණාගමනයත් බැණ දම්සක්පැවතුන්සූත්‍රය පටන් ගනු. මෙසේ දෙනම බැගින් වැඩහිඳ තුන්යම් රාත්‍රිය මුලුල්ලෙහි සූත්‍ර හත බැණ නිමවා මහපිරිත කියනතුරු උදය පටන් නැවතත් සරණාගමනය ආදි කොට යුග කියනු. නැවත මහසංඝයා වහන්සේ රැස්ව මහපිරිත කියා පිරිත්හුය නො හකුලාසිට ලිත සහ විහාරඅස්න කියා දෙවාලතල්පත් පෙළහර පිටත් කරනතුරු පිරිත් නො බැණ දෙ නමක් වැඩහිඳිනු.

පෙළහර පිටත්කරන වේලාවෙහි මහසංඝයා වහන්සේ රැස්ව දෙවාලපත කියවා දෙවදූතයාට භාර දී පෙළහර පිටත්කර යවා මහපිරිත කියා පිරි ත්පුගකියනු. මෙම දින සවස සියලු භික්ෂූන් මණ්ඩපයෙහි රැස්ව මංගලසූත්‍රය බැණ නිමවා දෙ නමක් වැඩහිඳ ඉසිගිලිසූත්‍රයෙහි අනන්තිමගාථා දෙක කියා පංසිල් දී ඉක්බිති දොර කඩඅස්න සහ අනුශාසනාව කියා මංගලාෂ්ටභේරිවාදනය කරවා සතර නම බැගින් වැඩහිඳ සියලු රාත්‍රිය මුලුල්ලෙහි ආටානාටියසූත්‍රය බැණ නිමවා සියලු දෙනා වහන්සේ රැස්ව වැඩහිඳ පිරිත්හුය ගෙන රතනසූත්‍රය සහ කරණීයමෙත්තසූත්‍රයද යං දුන්නිමිත්තං යනාදි ගාථාද බැණ දෙවියන්ට පින් දී තුණුරුවන් වැඳ ක්ෂමා කර තමතමනුත් පිළිවෙළින් ක්ෂමා කරගෙන අවසාන කට යුතුයි.

නිමි.



